විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. ..................................... දිනය / திகதி / Date 2009-03-15

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 08/ 2009**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## <u>විශ්‍රාමිකයන්ට නිවාඩු දුම්රිය බලපත් නිකුත් කිරීම</u>

විශ්‍රාමිකයන් සඳහා දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම ක්‍රමවත් කිරීමේ අරමුණෙන් පහත සඳහන් උපදෙස් නිකුත් කරනු ලැබේ.

01. පහත සඳහන් විශ්‍රාම වැටුප් වර්ග සඳහා දුම්රිය බලපත්‍ර හිමිකම ලැබේ.

1. සිවිල් විශ්‍රාම වැටුප්
2. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්
3. සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප්
4. සන්නද්ධ සේවා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්
5. පලාත් පාලන විශ්‍රාම වැටුප්
6. පලාත් පාලන වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්
7. ආබාධිත විශ්‍රාම වැටුප්

වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යටතේ අනත්දරුවාට හා ආබාධිතයාට දුම්රිය බලපත්‍ර හිමිකම පැවතියද ඔවුන්ගේ භාරකරුවන් වෙත එම හිමිකම නොමැති බව අවධාරණය කරමි.

02. විශ්‍රාමිකයන් විසින් සිය දුම්රිය බලපත් ඉල්ලීමේදී ඒ සඳහා ඔවුනට අදාල පොදු ආකෘති පත්‍ර 274 මගින් පමණක් ඉල්ලුම් කරන ලෙස දැන්විය යුතු අතර, බලපත්‍ර නිකුත් කිරීමට පෙර එම ආකෘතිපත්‍රයේ 8, 9, 10 වැනි තීරු කෙරේ ඔබ විශේෂ අවධානය යොමු කළ යුතුවේ. එසේ අවධානය යොමු කළ යුතු වන්නේ ස්වාමි පුරුෂයා - බිරිඳ යන දෙදෙනාම විශ්‍රාමිකයන් නම් හෝ එක් අයෙක් විශ්‍රාමිකයෙක් වන අතරදී අනෙක් අය තවමත් රජයේ සේවයේ නියුක්ත වී සිටී නම් දුම්රිය බලපත් ලබා ගත හැකි වන්නේ එක් අයෙකුට පමණක් වන හෙයිනි.

03. විශ්‍රාමිකයන් සඳහා බලපත් නිකුත් කිරීමේදී පහත පරිදි කටයුතු කළ යුතුය.

- ප්‍රාථමික ශ්‍රේණිය - 2 වැනි පංතිය
- ද්විතීය ශ්‍රේණිය - 1 වැනි පංතිය
- මාණ්ඩලික ශ්‍රේණිය - 1 වැනි පංතිය

04. යම් හෙයකින් දෙදෙනාම විශ්‍රාමිකයන් වන විට හෝ එක් අයෙක් විශ්‍රාමිකව, අනෙක් අය රජයේ සේවයේ නියුක්ත නම් එක් අයෙකුට ඉහළ පංතියක දුම්රිය බලපත් ලබා ගැනීමට හිමිකම පවතීනම් එම ඉහළ පංතියේ දුම්රිය බලපත්‍රය ලබා ගැනීමට හිමිකම ඇත.

උදා: විශ්‍රාමික ස්වාමි පුරුෂයා 11 වන පංතියේ බලපත්‍රයට හා රජයේ සේවයේ නියුක්ත බිරිඳට 1 පංතියේ දුම්රිය බලපත්‍ර හිමිකම පවතීනම් 1 වන පංතියේ බලපත්‍ර හිමි ඇයට පවුලේ සිය සාමාජිකයන් වෙනුවෙන් දුම්රිය බලපත්‍ර අයදුම් කිරීමට හැකියාව පවතී.

05. විශ්‍රාමිකයන් හට වසරකට දුම්රිය බලපත් කට්ටල දෙකකට හිමිකම ඇත. කට්ටල දෙකක් යන්නෙන් අදහස් කරන්නේ (යාම සහ ඒම සඳහා වූ) ද්විත්ව ගමන් වාර දෙකක් හෝ තනිගමන් වාර හතරකි. විශ්‍රාමිකයාගෙන් යැපෙන්නන් සඳහාද මෙම හිමිකම ලැබේ.

මෙහිදී යැපෙන්නන් ලෙස සලකන්නේ රැකියා විරහිත අවිවාහක දරුවන්ය. එහිදී වයස් සීමාව හෝ ස්ත්‍රී/ පුරුෂ බව නොසලකා දුම්රිය බලපත්‍ර නිකුත් කළ හැකිය.

06. එසේම අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවලදී දරුවන් තමන්ගෙන් (විශ්‍රාමිකයන්ගෙන්) යැපෙන බවට කොට්ඨාශ භාර ග්‍රාම නිලධාරී මහතාගේ ලබා ගත් සහතිකයක් මගින් සනාථ කර ගැනීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් සෑහීමට පත් වන්නේ නම් පමණක් බලපත් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

07. අවිවාහක විශ්‍රාමිකයකුගෙන් යැපෙන දෙමව්පියන්ට හා සහෝදර සහෝදරියන්ට මෙම බලපත්‍ර හිමිකම පවතී. එහිදීද අවශ්‍යයැයි හැඟෙන අවස්ථාවන්හිදී දෙමව්පියන්ගේ හා සහෝදර/ සහෝදරියන්ගේ ආදායම් තත්වය පරීක්ෂා කොට බලා ඔවුන් විශ්‍රාමිකයාගෙන් යැපෙන බවට ග්‍රාම නිලධාරී සහතිකයක් මගින් සනාථ කිරීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් සෑහීමකට පත්වන්නේ නම් පමණක් බලපත්‍ර නිකුත් කළ යුතු වේ.

08. යැපෙන්නන්ගේ දීමනා හා පුණ්‍යාධාර වැනි දීමනා ලබන අය වෙනුවෙන් දුම්රිය බලපත්‍ර නිකුත් නොකළ යුතු අතර, විශ්‍රාමිකයන් සඳහා නිදන, නිරීක්ෂණ, වායු සමීකරණය කළ වෙන්කළ මැදිරි පහසුකම් ලබා ගැනීමට අවකාශ නොමැති බවද වැඩිදුරටත් දන්වමි.

09. පලාත් පාලන විශ්‍රාමිකයන් සඳහාද ඉහත සඳහන් උපදෙස් ක්‍රියාත්මක කළ යුතුය.

කේ.ඒ. තිලකරත්න.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

පිටපත් :

1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.ස
2. විගණකාධිපති - දැ.ගැ.ස